ලංකාවිත්ති
LANKA VITHTHI




LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net



කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

# අවසාන වශයෙන් වචනයක්..!

**මේ** අද පළවන්නේ ලංකාවිත්ති පුවත්පතට අවුරුදු දහසය සම්පූර්ණ වන කලාපයයි. එසේම මේ පාඨක ඔබ දකින ලංකාවිත්ති අවසාන කලාපයයි. අවුරුදු දහසයක් පුරා අප ආ ගමනේ ආශ්චර්යය අපට මෙන්ම අපේ පාඨක සහෘදයින්ටද දැනී ඇත. දිනයක් දෙකක් හෝ ප්‍රමාද වුවහොත් ඔවුන් නොඉවසිලිවන්ත වන හැටියෙන් වටහාගත්තෙමු. ඔවුන්ගේ ඒ නොඉවසිල්ල අපේ සාර්ථකබව යම් පමණකින් ප්‍රකාශ කළ ඉඟියකි. පිටරටක සිට පළකරන මේ පුවත්පතට ලංකාවේ පළ වන සිංහල පුවත්පතකට වඩා අවංකකමක් ඇතැයි ලංකාවේ අපේ පත්‍රය කියවන බොහෝ දෙනා ලියා එවා තිබේ. ඔවුන් ඒ කියන්නේ හෘදයාංගමවමය. අප ලියන වදනකින්, කවියකින් සැතපුම් හත්දහසක් ඈත සිට අපේ හෘදය ස්පන්දනයවන ආකාරය ඔවුනට දැනී ඇත. ඊට වඩා සතුටක් කොහෙන් ලබන්නද?

අපටම ආවේණික අනන්‍යතාවක් තිබේ. පුවත්පතක් ලෙස අපි ස්වාධීනත්වයක් ගොඩ නගා ගත්තෙමු. අපේ ස්ථාවරය කුමක්දැයි ලංකාවිත්ති කියවන සියල්ලෝම පාහේ දැන් දැන සිටිති. මේ අවුරුදු දහසය තුළ අපේ ප්‍රතිපත්ති එක දශමයකින් හෝ වෙනස් වුනේ නැත. කිසිදු දේශපාලනික හෝ වෙනත් අන්ද මේ බලපෑමකට හෝ අප ගොදුරු වූවේ ද නැත. කන්න හිතුනාම අපට කබරගොයා තල ගොයා වුයේද නැත. වාසියක් ලබන්නට ප්‍රතිපත්ති තබා, අබමල් රේණුවක දෙයක් අප පාවා දුන්නේ ද නැත.

සිංහල පුවත්පතක් සතුව තිබිය යුතුයයි අප විශ්වාසකරන කැපවීම මෙන්ම, අප රටේ ගෞරවය, හැදියාව, සාරධර්ම ආරක්‍ෂා වන අයුරින් පෑන ලෙලවමින් පිටරටවල වෙසෙන අපේ සිංහල ජනතාවට ආභරණයක්, අත්වැලක් වීම ලංකාවිත්ති අරමුණ බව අප මුල්ම පත්‍රයෙන් කීවෙමු. අවුරුදු දහසයකට පසුව අද අවසාන දිනයේත් එසේ කියන්නට අපට හැකියාව තිබේ. ඒ අපේ හෝල්මාක් එක ය.

ඒ දුක්ඛදායක කාලයේ සිංහල ජනතාව අත් නොහැර ඔවුන් සමග වෙසෙමින්, ඔවුන්ගේ සිතේ ඇති දුක කණගාටුව බෙදාගනිමින් ඔවුන් දිරිමත් කරවන වදනක් ඔවදනක් ලංකාවිත්තියෙන් දැනවීමෙන් අපි ඔවුන්ගේ ලබැඳි හිතවතා වීමු. දේශපාලුවන් පස්සේ යමින් ඔවුන්ට ප්‍රශස්ති පුදමින් කිසි දිනක අකුරක් නොලිවෙමු. අපේ රටට ජාතියට මඬ වශයෙන් හෝ කිළුටක්, නින්දාවක් වන එක ද අකුරක් මෙතුවක් අපෙන් ලියැවී නැත. අපේ හිත සැනසෙන්නට ඒ හොඳටම ප්‍රමාණවත් ය.

පෑන තිබෙන්නේ හැමදාම සාක්කුවේ ගසා ගෙන යෑමට නොව අවශ්‍ය වූ විට රිසි සේ ළෙලවන්නටය. සැබෑ පත්‍රකලාවේදියෙකු අත පෑන යනු මුවහත් කඩුවකි. බොරුව ප්‍රෝඩාව නමැති කැලෑව කපා කොටා, ජන සමාජය හෙළ පෙහෙළි කර, සත්‍යයේ බීජ රෝපණය කරන ගොවියාණෝ ඔව්හු වෙති.

දහසය වසරක් ගෙවියන අද ඔබට අව ධාරණයෙන් කිවයුතු දෙයක් ඇත. ඒ මෙයයි

අප ලියූ කියූ අදහස් මෙන්ම අපේ වූ අවංකකම ද සිංහල පත්‍රයක් කරනු සඳහා කාගෙන්වත් ණයට ගත් දේ නොව, කවදත් අප තුළම පළපැදියම් වී තිබූ ආචාර ධර්මයන් ය. කොතරම් අභේනියකදී, ආපදාවකදී වුවද ඒ ගති අප අත්හැර නොගියේ එබැවිනි. පත්‍රයට එකකුත්, ජීවත්වීමට තව එකකුත් වශයෙන් ජීවනරටා දෙකක් අපට තිබුණේ නැත. කොටින්ම ලංකාවිත්ති පත්‍රය දිග හැරී විට ඔබ මෙතෙක් දුටුවේ අන් කිසිවක් නොව අපේ විවෘත සැබෑ හදවත ය.

මෙපමණ කලක් අප හා රැඳී සිටි හිතෛෂී ඔබ සැමට ආයුබෝවන් ! ඔබට ජයවේවා !



කර්තෘ

# අවුරුදු තිස්දහසකට වඩා පැරණි සිංහල අවුරුද්ද



**ලෝ**ව ප්‍රථම රජු ලෙස සැලකෙන මහා සම්මත මනු රජුගේ පුරය වූ ශ්‍රීලංකාවේ මන්නාරමට (මනු+නා+ර+ම) කෙළින්ම හිරු සිය කිරණ විහිදා ගමන් සකේ නව රවුමක් අරඹන මොහොත ශ්‍රීලංකාවේ සිංහල අවුරුදු උදාව ලෙස සැලකේ.

## අළුත් අවුරුද්දේ ඉතිහාසය

ඉහතකී ලෙස හිරු මන්නාරමට හරි කෙළින් මේෂ රාශියෙන් තම ගමන අරඹන්නේ අස්විද නැකතිනි. සංස්කෘත බසින් හෙළුරස, මේෂ යනුවෙන්ද, අස්විද නැකත, අශ්විනී යනුවෙන්ද හැඳින්වේ.

## විශේෂ දිනය

අවුරුදු යන වචනය අප රටේ ජනතාව වැඩිපුරම යොදාගෙන ඇත්තේ මාස 12 ක් යන්න අර්ථවත්කිරීම පිණිස වුවද එහි නියම අරුත මෙයයි.

වරු යනු දවසයි. එම වදන නිරුක්ති අනුව මෙසේ වරු> වරුතු> වුරුතු> වරුදු යනුවෙන් පෙරළේ. 'අ' යන්න උපසර්ග යක් ලෙස මුළට යොදා ඇත්තේ එකක් බව හැඳින්වීමටය. අ + වරුදු = අවුරුදු වේ. එහි තේරුම විශේෂ දවස යන්නය. අවුරුදු, ශ්‍රීලංකාවට විශේෂ දවසකි.

## ශ්‍රී ලංකාවට මෙය විශේෂ දවසක් වූයේ ඇයි ?

සිංහලයේ ප්‍රථම රජුවන මහා සම්මත මනුගේ පුරය වන මන්නාරමට හරි උඩින් හිරු ගමන් පථය ඇරඹීම විශේෂ කරුණක් වූවාසේම අප ඉතිහාසයට අනුව මේ මොහොතේදීම මනු රජු අභිෂේක ලබා සිහසුනට පත්වීමද ශ්‍රීලංකා වාසීන්ට විශේෂ දිනයක් වන්නේ ය. මේ සිදුවූයේ ක්‍රිස්තු පූර්ව 28,200 වසරේ දී ය.

එබැවින් මේ 1977 අප්‍රියෙල් මස 13 වෙනි ඉරුදින උදාවන සිංහළ අවුරුද්ද මෙම විශිෂ්ඨ සිංහල උත්සවයේ 30,197 වෙනි වාර්ෂික සැමරීමයි.

පැරණි හෙළ දිව හෙවත් හෙළයන්ගේ දිවයින ශ්‍රීලංකාව පෙර සිට හැඳින්වූ නම් රාශියක් ඇති බව අපි දනිමු. ඉන් එක නාමයක් මන්ඩු ය. එහි අරුත මනුගේ දූපත යන්නයි. මන්ඩු පසුව සිමන්ඩු, පලේසි මන්ඩු හා දිල්මුන් යනුවෙන්ද ප්‍රකට වී ඇත. එකල අප දිවයින් ප්‍රමාණයෙන් විශාලව පැවති බව ʹleander Condrotov ලියූ Riddles of the three oceans නම් පොතේ සඳහන් වේ.

ලංකා දූපත වතුරේ ගිලීයාම වරින්වර සිදුවූ බව රාජාවලිය නම් මහා ග්‍රන්ථය පෙන්වා දෙයි. කැළණිතිස් රජු, රාවණ රජු හා තාරක රජුගේ රාජ්‍ය සමයන්හිදී විශාල වශයෙන් මුහුද ගොඩගැලීම නිසා ලංකාව ක්‍රමයෙන් කුඩා වී ගියේ ය.

එසේ ලංකාව යටවීමට එක් හේතුවක් නම් ජාවා දූපතේ .ක්‍රකටෝා. සහ ඉතාලියේ .විසූවියස්. නම් මහා ගිනිකඳු පුපුරායාම බව භූගෝල විද්‍යාඥයෝ පවසති. ලංකාව වටා පිහිටා ඇති කුමාරෝ, සීෂෙල්ස්, මාලේ, ලක්දිව් ආදී කුඩා දූපත් මැඩගස්කර් දූපතට වඩා පමණින් කුඩා වන්නා සේම ඒවා කොරල් පර වලින් බිහිවූවක් නොවේ. ඒ දූපත් අන් කිසිවක් නොව මුහුදට ගිළීගිය ශ්‍රීලංකාවේම කොටස් බව දැන් පිළිගත් මතයකි.

## හිරුට ඇති නම්

'රා' වදන පැරණි ඊජිප්තු බසින් හිරු යන්නයි. එය අපේ බසින්ද හිරු හැඳින්වීමට යෙදේ. හිරුගේ ස්වභාවය වූ රශ්නයට රත් (ර + අත්) කියා යෙදේ. එම ගිණියම් පාට රතු ය. රවි යන හිරු හඳුන්වන සංස්කෘත වචනය (ර+ වි) ඔවුන් අපෙන් උපුටාගත්තකි. එලෙසම හිරුට සංස්කෘතයේ යෙදෙන මිත්‍ර යන්න සිංහලයෙන් බිඳී ආ මිහි + තුරු = මිතුරු යන්නයි. විශාල තාරකාව යනු එහි අරුතයි. සංස්කෘතය අපෙන් උපුටාගත් වචන එමට ඇත. සිංහල භාෂාව නිසැකවම සංස්කෘතයට වඩා පැරණි භාෂාවක් බව මෙයින් නොපෙනේද?

## හින්දු නම

සිංහල අවුරුද්ද හින්දු අවුරුද්ද ලෙසද හැඳින්වේ. අවුරුද්දට ඇති සිංහල උරුමය මෙයින් වටහාගත යුතුය. හින්දු ආගම රාවණ වැනි සිංහල රජවරුන් ඇදහූ දහමකි. එය බිහිවූයේ ලංකාවේය. හින්දු යන වචනය බිඳී ආයේ සාගරයේ දූපත යන අරුත් දෙන සින්ධු යන එකල ලංකාව හැඳින්වූ වචනය බිඳීමෙනි. (සින්දු + දූ = සින්දූ = හින්දු) වචනයේ නිරුක්තියම එය සිංහල බව පෙන්නුම් කරයි. යමක් ඇති කිරීම, සුරැකීම හා විනාශකිරීම යන සූර්යයා සතු බලය දේවත්වයේ ලා සලකා හිරු පිදීම ඇරඹුවේ ආදියේ කතරගම රජ පෙළපතට අයත් ඊශ්වර විසිනි. අපේ ඉරු -වේද ඉන්දියාවට රිග්-වේද විය. මේ සියල්ල සිදුවූයේ ක්‍රි. පූ. 6000 ට පෙර දී ය.

## හිරුදෙව් යැදුම

හිරු දෙවියන්ට වැඳුම් පිදුම් කළ අතීත සිද්ධස්ථාන වචන වෙනස්වීමෙන් වෙනත් ආකාරයෙන් හැඳින්වෙන්නට වීය. මන්නාරමේ ඇති හිරුදෙව්ඉසුරු = තිරුකේතිශ්වරම් යනුවෙන්ද, ත්‍රිකුණාමළයේ හිරුගණ ඉසුරු = තිරුකෝනේශ්වරම් යනුවෙන්ද යෙදීම මෙයට නිදසුන් වේ. දෙවුන්දර සහ කෝන්ගල හිරුගල්තිලක දේවාල අද විෂ්ණු සහ උපුල්වන් දෙවොල් බවට පත්ව ඇත.

ඊජිප්තුවේ සහ බැබිලෝනියාවේ මුල්ම මානව ශිෂ්ඨාචාරයටත්, යුරෝපයේ අයෙ-්මය යුගයටත්, සිය වසර ගණනාවකටත් පෙර දුරාතීතයේ කෘෂිකාර්මික දියුණුව ලබාසිටි ශ්‍රීලංකාවේ සිංහල වැසියන් සූර්ය වන්දනාවත් ඒ මත පදනම් වූ අළුත් අවුරුද්දත් ලොවට නිර්මාණය කිරීම පුදුමයක් නොවේ.

අපේ මුතුන් මිත්තන් කළ කී ඒ සියළු වත් පිළිවෙත් කිසිවක් පැහැර නොහැර සුළු සුළු වෙස්කම් ඇතිව වුවද අපි මේ දක්වාම අනුගමනය කරන්නෙමු.

(අරිසෙන් අහුබුදු ශූරීන් විසින් 1977 දී ලියන ලද ඉංග්‍රීසි ලිපියක සිංහල අනුවාදයයි මේ )

♦ *අභාවප්‍රාප්ත හෙළබස්පති*
***අරිසෙන් අහුබුදු ශූරීන් විසිනි***

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතොපදේශයෙන්

අප්පස්සුතො සුතො අප්පං
බහු මඤ්ඤති මානිකො
සින්ධුදකං අප්පසන්තො
කූපෙ සොයංච මණ්ඩුකො

**අර්ථය** : ස්වල්ප දෙයක් ඉගෙනගත්, නොහොත් අල්පශ්‍රැත පුද්ගලයා ඉගෙනගත් ස්වල්ප වූ දෙය නිසාම මානයෙන් යුතුව තමා බහුශ්‍රැත හෙවත් බොහෝ උගත් කෙනෙකැයි සිතයි. එය හරියටම කවදාවත් මුහුදක් නොදුටු ළිං මැඩියා ළිඳ මුහුද මෙන් සිතන්නාක් වැනිය.

**අ**පේ සමාජයේ බොහෝ දෙනෙකුට වැළඳෙන රෝගයකි යම් දෙයක් ටිකක් දැනගත් පමණින් තමන් ඒ පිළිබඳ විශාරදයෙකු මෙන් අභිමානයක් ඇතිකරගෙන අන් අය අවමානයට ලක්කිරීම. ඕනෑම දෙයක් යම් පමණකට හෝ ඉගෙනීම තම ජීවිතයට කෙදිනක හෝ පිහිට වන බව අමුතුවෙන් කිවයුතු නැත. ඉගෙන ගත් දේ තම යහපත පිණිස හෝ අන් අයගේ යහපත පිණිස හෝ යොදවා ගන්නේ නම් ඉන් සමාජයට සිදුවන යහපත අගේ කළ යුත්තකි. තමාගේ සහ අනුන්ගේ සුබසාධනය පතා සෑම කෙනෙක්ම යම් ශිල්ප ශාස්ත්‍රයක් පිළිබඳ මනා පුහුණුවක් ලබාගැන්ම තමාගේ ජීවනෝපාය පිණිසත්, එය සමාජ සුභසාධනය සඳහාත් යොදා ගනිමින් සමාජ මෙහෙවරක යෙදීමෙන් තමාට සතුටු විය හැකිය.

අද කාලයේ විදියට වෛද්‍ය වෘත්තිය යනු එවැන්නකි. පරෝපකාරය සඳහාම කැපවූ වෛද්‍යවරයෙකුගේ සේවාව මිළකළ නොහැකිය. නිසියාකාරව තම කටයුත්ත රාජකාරියක් මෙන්ම ඉන් ඔබ්බට ගිය මානුෂීය පැත්ත ගැන සිතා කරුණාවෙන් දයා වෙන් මනුෂ්‍ය ප්‍රජාව උදෙසා තම දැනුම යොදාගන්නේ නම් එය ආර්ථිකමය වූ වටිනාකමකට වඩා අමිල වූ උතුම් පින්කමකි.

නමුත් ඇතැම් අය තම දැනුම, වෘත්තීය සුදුසුකම්, ආදායම් ආභරණයක් ලෙස ආරෝපණය කරගැනීමෙන් එම ආභරණය නිසා තමා අලංකාරවීමකට වඩා සමාජයේ අවමානයකට ලක්වීම ඔහුටත් නොදැනීම සිදුවන්නකි.

පලින් බර වූ ගසෙහි අතු ඉති බිමට නැමී පවතින්නාක් මෙන් දැනුමෙන් පොහොසත් වන තරමට බුද්ධිමත් කෙනා උඩඟු නොවී නිහතමානීව කටයුතු කිරීමෙන් ඔහුගේ වටිනාකම තවත් වැඩිවෙනවා පමණක් නොව ඔහුගේ හෝ ඇයගේ ගුණ කථනයද දස දෙස පැතිරී යයි.

පසුගිය දිනක කාටත් අසන්නට දකින්නට ලැබුණු පුවතකි ලංකාවේ ව්‍යාජ සංවිධානයකින් මුදලට ආචාර්ය උපාධි පිරිනැමීම. එම ආයතනය පමණක් නොව තවත් බොහෝ ආයතන මුදල් ඉපයීම පරමාර්ථය කරගනිමින් උපාධි හා ගෞරව නාම පිරිනමති. පිරිනමන අය මෙන්ම එය ලබාගන්නා අයද මඳකට හෝ කල්පනා කළ යුතුයි තමන් එම උපාධිය හෝ ගෞරව නාමය ලැබීමට සුදුසු ද කියා.

බොහෝ දෙනා තනතුරු පිළිබඳ කෑදරකමෙන් ඒවා ලබාගැන්මට නෙකරන දෑ කරමින් අනවශ්‍ය ලෙස මුදල් වියදම් කරන්නේ නම් ඒ අය මුල් පද්‍යයේ විස්තර කරන ළිං මැඩියනට වඩා වෙනසක් නැත.

ළිඳේ වසන මැඩියාගේ මුලු ලෝකයම ළිඳේ ඇති ජලය ප්‍රමාණයමයි. ඉන් පරිබාහිරවූ මුහුදක් හෝ ලොවක් ගැන කිසිදු වැටහීමක් ඔහුට නැත. යම් විෂයක් තොලගෑ පමණින් ඇතැම් අය සිතන්නේ තමන් ඒ පිළිබඳ විශාරද දැනුමක් ලබා ඇති බවයි. නමුත් කුශාග්‍ර බුද්ධිය හෙවත් තීක්‍ෂණව කල්පනාකිරීම ඊට වඩා වෙනස් වූ දෙයකි. කුශාග්‍ර බුද්ධිමතා සැබෑ පණ්ඩිතයෙකි. අවංකව නිහතමානී කෙනෙකු අන් අය තුළ ඇති හොඳ පැත්තද දකී. අන් අය අවමානයට ලක් නොකරයි. ඔහු සැබැවින්ම දුලබ පුද්ගලයෙකි. එබඳු දුලබ අයගේ පහළවීම ද විරල වූවකි.



♦ *රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති*
***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***
***ගල්ටැම්මණ්ඩිය පුරාණ විහාරය***
***ඔක්කම්පිටිය - මොනරාගල***
**Sri Lanka**


**NORMA & Co**
**Associate Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

***Colombo Office***
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632